IHRA
UNIVERSITY OF COLOMBO

102

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2014/2015

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2016 නොවැම්බර්)

## BLE 201 - සාර්ව ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(4) ඝණක යන්ත්‍ර භාවිත කළ හැකිය

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. සාර්ව ආර්ථික විද්‍යාව සහ සූක්ෂම ආර්ථික විද්‍යාව අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. "සාර්ව ආර්ථික විද්‍යාව වඩාත් වැදගත් වන්නේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන්ටය." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. "පූර්ණ සේවා නියුක්තිය අත්පත් කරගැනීමට රජය කටයුතු කිරීමේදී උද්ධමනකාරී බලපෑම් ඇතිවිය හැකිය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. i. අංශ දෙකක් පමණක් ඇති කල්පිත ආර්ථිකයක ආයෝජන ගුණකයේ අගය 5 ක් ලෙස ගණන් බලා තිබේ. මෙම ආර්ථිකයේ ආයෝජනය රු. 500 කින් ඉහල ගියවිට ජාතික ආදායම මත ඇතිවිය හැකි බලපෑම ගණනය කරන්න.

(ලකුණු 06)

ii. මෙම ආර්ථිකයේ ස්වායත්ත පාරිභෝජනය රු.100 සහ පෞද්ගලික ආයෝජනය රු. 200 මට්ටමක පැවතියේ නම් තිබිය යුතු ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 07)

iii. මෙම ආර්ථිකයට අදාල ඉතිරිකිරීම් ශ්‍රිතය කුමක්ද? එම ඉතිරිකිරීම් ශ්‍රිතය ආශ්‍රයෙන් සමතුලිත ජාතික ආදායමේදී කාන්දු වීම් (withdrawal) විදීම් (injection) වලට සමාන වන බව පෙන්වන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

03. අංශ හතරක් සහිත කල්පිත ආර්ථිකයකට අදාල පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| | | |
|---|---|---|
| ස්වායත්ත පාරිභෝජනය | = | රු. 100 |
| ආන්තික පාරිභෝජන නැඹියාව (MPC) | = | 0.8 |
| ආයෝජනය | = | රු. 200 |
| ස්වායත්ත බදු. | = | රු. 100 |
| රාජ්‍ය වියදම | = | රු. 500 |
| ආනයන ශ්‍රිතය | = | M = 100 + 0.2Y |
| අපනයන | = | රු. 300 |

i. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 05)

ii. රාජ්‍ය වියදම් ගුණකය සොයන්න.

(ලකුණු 05)

iii. වැය කළ හැකි ආදායම (Disposable Income) ගණනය කරන්න.

(ලකුණු 03)

iv. පාරිභෝජන වියදම ගණනය කරන්න.

(ලකුණු 02)

v. සමතුලිත ආදායමේදී කාන්දුවීම් විදීම්වලට සමාන වන බව තහවුරු කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. කල්පිත ආර්ථිකයක භාණ්ඩ සහ මුදල් වෙළඳපොළවලට අදාල තොරතුරු ඔබට සපයා ඇත.

| | | | |
|---|---|---|---|
| C | = | 200 + 0.75 yd | පාරිභෝජන ශ්‍රිතය |
| G | = | 500 | රාජ්‍ය වියදම |
| T | = | 100 | බදු |
| I | = | 300 – 10r | ආයෝජන ශ්‍රිතය |
| Ms | = | 400 | මූර්ත මුදල් සැපයුම |
| $L_1$ | = | 0.2y | ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම |
| $L_2$ | = | 10r | සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම |

i. IS සමීකරණය ලබාගන්න

(ලකුණු 04)

ii. LM සමීකරණය ලබාගන්න

(ලකුණු 04)

iii. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 06)

iv. ඉහත ලබාගත් තොරතුරු දළ ප්‍රස්ථාර සටහනකින් පෙන්වන්න

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

05. i. රටක අයවැය ප්‍රතිපත්තිය සහ මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක්දැයි කෙටියෙන් වෙන වෙනම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. "රටක මූල්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය ආයෝජන ඉල්ලුමේ පොලී නම්‍යතාවය මත (interest elasticity of investment demand) තීරණය වේ." සුදුසු ප්‍රස්ථාර යොදාගෙන මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 14)

(මුළු ලකුණු 20)

06. i. විදේශ විනිමය වෙළඳපොල යනු කුමක්දැයි හඳුන්වා එහි ප්‍රධාන ගණුදෙනු පාර්ශවයන් නම් කරන්න.

(ලකුණු 08)

ii. විදේශ විනිමය ඉල්ලුමට සහ සැපයුමට බලපාන සාධක වෙනවෙනම හඳුනාගන්න.

(ලකුණු 08)

iii. පහත සඳහන් විනිමය අනුපාතයන් සැලකිල්ලට ගෙන ලාභදායී පාරස්පර්යා (profitable arbitrage) කටයුතු සඳහා අවස්ථාවක් තිබේදැයි හඳුනාගන්න.

| | | |
|---|---|---|
| $ 1.96 | = | £ 2 (පවුම් 2)<br>ලන්ඩන් වෙළඳපොළ |
| පවුම් 1 | = | 2.5 (ජර්මන් මාර්ක්)<br>නිව්යෝක් වෙළඳපොළ |
| ජර්මන් මාර්ක් 5 | = | $ 2 ටෝකියෝ වෙළඳපොළ |

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

07. i. මිල උද්ධමනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ඉල්ලුමෙන් ඇදුනු (Demand Pull) සහ පිරිවැයෙන් තල්ලු වූ (Cost Push) උද්ධමනය සුදුසු ප්‍රස්ථාර යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

08. පහත සඳහන් සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

i. සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම.

ii. ස්ථානීය සහ ඉදිරි විනිමය අනුපාතය (spot and forward)

iii. විනිමය වෙළඳපොළ පාරස්පර්යා සහ සමපේක්ෂණ කටයුතු. (Arbitrage and speculation activities)

iv. ආර්ථික ස්ථායිතාවය (Economic Stability)

(මුළු ලකුණු 20)